## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - 2024

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 04 පිරවීමට අදාළව නිලධාරීන් උසස් කිරීම සඳහා අංක 1840/51 හා 2013.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. වැටුප් පරිමාණය**

2016.02.25 දින අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.88,000-12X2,700-120,400(SL-3-2016) වේ.

**03. සපුරාලිය යුතු සුදුසුකම්**

03.1 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වසර 18ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) උපයාගෙන තිබිය යුතුය.

03.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්යසාධනය සතුටුදායක මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පැවතීම.

03.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

03.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ පුහුණු අවශ්‍යතා සපුරා තිබීම.

04. මෙම තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් උසස් කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාළ ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2024.10.03** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්<br>
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>
තැ.පෙ 13, ගැටඹේ<br>
පේරාදෙණිය

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති සක්‍රීය සේවයේ නියුතු අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගනු ලබන නිලධාරීන් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

**06.** වව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| **ජ්‍යෙෂ්ඨතාවය ලකුණු 40** | I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලය ඉක්මවා ඇති වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br><u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණ</u> X අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු X 12 + මාස )<br>වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස ) |
| **කුසලතාවය ලකුණු 60** | **2.1 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා - උපරිම ලකුණු 10**<br><br><u>I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණ</u> X අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br>I ශ්‍රේණියේ තනතුරක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br><br>**2.2 වෘත්තීය ක්‍රියාකාරකම් (ඉදිරිපත් කිරීම) - උපරිම ලකුණු 20**<br>• අන්තර්ගතය තුළ ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය - ලකුණු 08<br>• පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාර - ලකුණු 05<br>• ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 04<br>• සැකසුම, නිර්මාණය - ලකුණු 03<br><br>(නිලධාරියා විසින් පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් පරිගණක ආශ්‍රයෙන් කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් වේ. එය අදාළ කාලසීමාවට සරිලන ලෙස ස්ව අභිමතය පරිදි තෝරාගත හැකිය. නිලධාරියා විසින් ඉටු කරන ලද රාජකාරි බවට සනාථ කිරීම සඳහා වන ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.)<br><br>**2.3 වෙනත් සුදුසුකම් - උපරිම ලකුණු 25**<br>පළාත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ හෝ ප්‍රශංසා ලිපි (පොදු 230බී ආකෘතියෙන්) හෝ<br>අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන හෝ<br>අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරාවල පළ කරන ලද පත්‍රිකා<br><br>(මෙහිදී නිලධාරියාගේ ඍජු දායකත්වය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සනාථ කළයුතු අතර, එක් ලේඛනයකට ලකුණු 05 බැගින් උපරිම අවස්ථා 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. ප්‍රශංසා ලිපි අයදුම්පත් කැඳවීමේ දිනට පෙර දිනයක නිකුත් කරන ලද්දක් විය යුතුය.)<br><br>**2.4 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය - උපරිම ලකුණු 05**<br>පෙන්නුම් කරන ලද නායකත්ව කුසලතා - ලකුණු 02<br>භාෂා හැකියාව සඳහා - ලකුණු 01<br>සන්නිවේදන කුසලතාව සඳහා - ලකුණු 02 |
| **මුළු ලකුණු 100** | |

07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරගන්නා ලද අයදුම් පත්‍රය හා වෙනත් ලේඛනවල පිටපත් නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඇතුළත් ගොනුවක්ද සමඟ යොමු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ජානක ධර්මකීර්ති**
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය